## නීතිය හා  මහජන ආරක්ෂා ක්ෂේත්‍රය
## (Law, Public Safty and Security Sector)

ඔබ මිනිසුන් ආරක්ෂා කිරීමට කැමති ද? ඔබ අනතුරු හමුවේ අවදානම් දැරීමට කැමතිද ? ඔබ නීතිය සමඟ වැඩ කිරීමට කැමති ද?

නීතය, මහජන ආරක්ෂා ක්ෂේත්‍රයෙහි රැකියා කරන්නන් විවිධ තැන්වල ස්ථානගත වී ඇත. උදාහරණ වශයෙන් ඔබට මහජනතාව ආරක්ෂා කිරීම සඳහා පොලිස් නිලධාරීයෙකු හෝ ආරක්ෂක නිලධාරියෙකු ලෙස නීතිය ක්‍රියාත්මක කළ හැකි ය. නැත හොත් ඔබ ගිනි නිවන භටයෙකු වශයෙන්  ආරක්ෂාව සැපයිය හැකි ය.

පුද්ගලයන්ට නීතී සේවා සැපයීම. නිදසුන් වශයෙන් ඔබට බන්ධනාගාරයක් තුළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කළ හැකි ය. ඔවුන්ගේ නිත්‍යානුකූල අයිතිවාසිකම් පිළිබඳ ගනුදෙනු කරුවන්ට උපදෙස් දිය හැකි ය. නැතහොත් උසාවි නඩුවලට සහය වීම සඳහා නීතමය ක්‍රියා පටිපාටි පරියේෂණ කළ හැකි ය.

**නීතිය හා  මහජන ආරක්ෂා ක්ෂේත්‍රයේ රැකියා/ වෘත්ති,**

**1. පරිපාලන නීති නිලධාරී**
රජයේ වැඩසටහන්වලට අදාළ හිමිකම් පිළිබඳ නඩු විභාග පැවැත්වීම සහ තීරණ ගැනීම.

**2. සමථ මණ්ඩලවල කටයුතු කරන්නා**
අධිකරණ පද්ධතියේ පිටතින් ගැටුම්  නිරාකරණය කිරීමට කටයුතු කරන්නා.

**3. ජේලර්**
බන්ධානාගාරවල රුදව්යන් ආරක්ෂා කරන්නා.

**4. අධිකරණ වාර්තාකරු**
විවිධ ක්‍රම සහ උපකරණ භාවිතා කරමින් නීතිමය සාක්ෂි වාර්තා කරන්නා.

**5. මාර්ග ආක්ෂක**
වීදිවල, පාසල් අසල දුම්රි හරස් මාර්ගවල හෝ ඉදිකිරීම් ස්ථානවල ගමනාගමනයට මග පෙන්වීම හෝ පාලනය කිරීම.

**6. රහස් පරීක්ෂක**
අපරාධ විමර්ශනය කිරීම හෝ විසඳීම

**7. හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පී සහ පරිපූරක වෛද්‍ය** හදිසි අවස්ථාවල දී රෝගී සහ තුවාල වූ පුද්ගලයන්ට සත්කාර කරන්නා.

**8. ගිනි නිවන භට**
ගිනි පාලනය කිරීම සහ නිවා දැමීම සහ හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම.

**9. අධිකරණ විද්‍යා කාර්මික ශිල්පී**
සාක්ෂි එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීමෙන් අපරාධ විමර්ශනය කිරීමට සහාය වීම.

**10. වන ගිනි පරීක්ෂක සහ නිවාරණ විශේෂඥ**
ගිනි නිවීමේ රෙගුලාසි බලාත්මක කිරීම සහ ලැව් ගිනි වැළැක්වීමේ ක්‍රම නිර්දේශ කිරීම.

**11. විනිසුරු සහ මහේස්ත්‍රාත්**
අපරාධ හෝ සිවිල් උසාවිවල නඩු සඳහා උපදෙස් දීම සහ තිරණය කිරිම.

**12. අධිකරණ නීති ලිපිකරු**
උසාවියේ හෝ නීති පර්යේෂණ පැවැත්වීමෙන් විනිසුරුවරුට සහාය විම.

**13. නිතීඥ**
නීතිමය ලියකියලි  සකස් කිරීම සහ නීතිමය කටයුතුවල දී ගනුදෙනුකරුවන් නියෝජනය කිරීම.

**14. නීති ලේකම්**
නීතිමය ලියකියවිලි සහ ක්‍රියා පටිපාටි භාවිත කරමින් ලිපිකරු රාජකාරී ඉටු කරන්නා.

**15.  ජීවිතාරක්ෂක**
ජීවිත ආරක්ෂා කිරීමට තටාක, වෙරළ වැනි ස්ථාන නිරක්ෂණ කරන්නා.

**16. පොලිස් නිලධාරී**
නීතිය ක්‍රියාත්මක කිරීමේ පිළිවෙළ පවත්වා ගෙන යාම සහ ජීවිත හා දේපළ  ආරක්ෂා කිරීම.

**17. හදිසි ප්‍රතිචාර  මධ්‍යස්ථාන පණිවිඩ සහායක**
පොලිසිය, ගිනි නිවන හා ගිලන්රථ සේවාව රේඩියේ දුරකතන හෝ පරිගණක උපකරණ ඇසුරෙන් ක්‍රියාත්මක කරන්නා.

**18. පුද්ගලික රහස් පරීක්ෂක සහ විමර්ශක**
නෛතික පුද්ගලික හෝ මූල්‍ය කරුණු පිළිබඳ තොරතුරු සොයා විශ්ලේෂණය  කරන්නා.